දිවි තොර කරගැනීම් කෙතරම් දුරට සමාජ ගැටළුවක් බවට පත්ව තිබෙන්නේද යන්න, දිවි තොර කරගැනීම් සම්බන්ධ සංඛ්‍යාලේඛන විමසීමේදී පෙනී යයි. ලෝක සෞඛ්‍ය සංවිධානය 2021 වසරේදී සඳහන් කරන්නේ එක් වසරක් තුළ ලොව පුරා සාමාන්‍යයෙන් 700,000 පමණ පුද්ගල ප්‍රමාණයක් දිවි තොර කරගැනීම් ඔස්සේ මිය යන බවත්, එම සෑම දිවි තොර කරගැනීමකටම දිවි තොර කරගැනීමට තැත් කිරීම් ගණනාවක් සිදුවන බවත් වේ. දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යෑමේ හැකියාවක් ඇති බවද පර්යේෂණ මගින් පෙන්වා දෙයි. දිවි තොර කරගැනීම් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී මාධ්‍ය මගින් විශේෂ ප්‍රවේසමක් සහ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල වීමක් අවශ්‍ය වන්නේද ඒ හෙයිනි.

එම ආචාර ධර්මයන් උල්ලංඝනය වීම් වලට උදාහරණ ලෙසින් පහත පුවත් වාර්තාවන් පෙන්වා දිය හැක. මෙහිදී දිවි තොර කරගත් ආකාරය දක්වා ඇති අතර, දිවි තොර කරගැනීමට හේතුවද සරල කොට දක්වා ඇත. දිවි තොර කරගත් ආකාරය දැක්වීමේ ගැටළුව වන්නේ, එය තවත් අයෙකු අනුකරණය කිරීමේ හැකියාවක් තිබෙනා බැවිනි. එසේම දිවි තොර කරගැනීමේ හේතුව සරලව දැක්වීම ඔස්සේ, එය ඊට සමාන ගැටළුවක සිටින අයෙකු තමන් වෙත අනන්‍ය කරගැනීමත්, ඒ ඔස්සේ එය දිවි තොර කරගැනීම් සඳහා උත්ප්‍රේරකයක් වීමත් සිදුවිය හැක.

එසේම, උපකාරක අංක සඳහන් කිරීම දිවි අහිමි කරගැනීම් වාර්තාකරණය සඳහා අත්‍යාවශ්‍ය වනු ඇත්තේ, ඒ ඔස්සේ දිවි අහිමි කරගැනීමේ නැඹුරුවක් ඇති තවත් අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට ඉඩක් තිබෙන නිසායි.

මූලාශ්‍ර:

https://media.samaritans.org/.../Samaritans_Media...
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://www.who.int/news-room/fact-sheets/detail/suicide

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926
**#MediaEthicsSL #lka #sinhalanews #Divaina #Lankadeepa**